**වෘත්තීය අංශය** – නිෂ්පාදනය
**උප අංශය** - ඉදිකිරීම්

**වෘත්තීය නාමය/ රැකියාව/ වෘත්තිය** - ඇලුමිනියම් පිරිසැකසුම් කාර්මික

**වෘත්තීය/රැකියා විස්තරය** -
"ඇලුමිනියම් පිරිසැකසුම්කරු " යනු ඇලුමිනියම් භාවිතයෙන් දොර,දොර රාමු, කවුළු, කවුළු රාමු, ඉදිරි කෙවුම්, ප්‍රදර්ශන කුඩු , පැන්ට්‍රි කබඩ්, ඉණිමං, සිවිලිම්, අභ්‍යන්තර බෙදුම්, සාප්පු ඉදිරිපස ආදිය අත් ආයුධ සහ බල මෙවලම් භාවිත කරමින් නිර්මාණය කරන්නාය.

**වෘත්තීය/රැකියා රාජකාරි –**

- කවුළු පිරිසැකසුම් කර සවි කිරීම
- දොරවල් පිරිසැකසුම් කර සවි කිරීම
- බෙදුම් සහ සාප්පු ඉදිරිපස අදාළ කොටස් පිරිසැකසුම් කර සවි කිරීම
- ඉණිමං පිරිසැකසුම් කිරීම
- ඉදිරි කෙවුම් පිරිසැකසුම් කර සවි කිරීම
- සංයුක්ත පැනල් පිරිසැකසුම් කර සවි කිරීම
- පදම් කළ වීදුරු සහ දොරවල් සවි කිරීම
- ප්‍රදර්ශන කුටි පිරිසැකසුම් කිරීම
- නාන කුටි පිරිසැකසුම් කර සවි කිරීම
- රෝලර් දොරවල් පිරිසැකසුම් කර සවි කිරීම
- සිවිලිම් පිරිසැකසුම් කර සවි කිරීම
- විවිධ ඇලුමිනියම් පිරිසැකසීම
- පිරිසැකසුම් කරන ලද භාණ්ඩ නිම කිරීම
- අත්වැට පිරිසැකසුම් කර සවි කිරීම
- මුළුතැන්ගෙයි කැබිනට් පිරිසැකසුම් කර සවි කිරීම
- පැනල් දොරවල් පිරිසැකසුම් කර සවි කිරීම

**වැඩ පරිසරය** -
මෙය වැඩමුළු සහ / හෝ වැඩබිම්වල (ව්‍යාපෘති) සිදුවිය හැකිය.

**මසකට අපේක්ෂිත ආදායම -**

පුහුණුවන්නන් සඳහා මසකට රු. 25,000 කි

NVQ 3 වන මට්ටම – 40,000.00 වැඩි
NVQ 4 වන මට්ටම – 70,000.00 වැඩි



**පවතින වෘත්තීය මාර්ග -**
ඇලුමිනියම් කාර්මික ශිල්පී, අධීක්ෂක ඇලුමිනියම් සැලසුම්කරු , අලෙවි කළමනාකරු, ව්‍යවසායකයා , ව්‍යාපාරිකයා

**අවශ්‍ය නිපුණතා / ගුණාංග සහ පුහුණුව -**
වසරක සේවා පළපුරුද්ද

**රැකියා අවස්ථා පවතින අංශ -**
රජය / පුද්ගලික / ස්වයං

**වෘත්තීය/රැකියාව සඳහා ප්‍රවේශ සුදුසුකම් -**

- සාක්ෂරතාවය, සංඛ්‍යා
- ශාරීරික යෝග්‍යතාවය, මූලික කුසලතා උදා: දළ රූප සටහන් ඇඳීමේ හැකියාව

**පවතින පුහුණු මාර්ග -**
NVQ 3 සහ 4 වන මට්ටම

**පවතින දේශීය රැකියා සංඛ්‍යාව** - දේශීය හෝ විදේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවත්නා ඉල්ලුම අනුව වර්තමානයේ මෙම රැකියාවන් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

(බොහෝ පිරිසැකසුම්කරුවන් ව්‍යවසායකයින් / ස්වයං සේවකයින් බවට පත්වේ)

**රැකියා අවස්ථා පවතින කලාප හෝ රටවල්**

රට පුරාම පවතී , බස්නාහිර පලාතට වැඩි අවස්ථාවක් තිබේ. විදේශ රැකියා සඳහාද අවස්ථාව ඇත.

**රැකියාස්ථ පුහුණුව -**
අවම මාස 6 ක

## වෘත්තීය / රැකියා සම්බන්ධ ගැටළු නිරාකරණය සඳහා වෙබ් සබැඳි / යූ ටියුබ් / වීඩියෝ / ප්‍රවීණයන්

www.tvec.gov.lk, www.youthjobs.lk ඇලුමිනියම්, කාර්මික ආයතන සහ අදාල කර්මාන්ත සංගම්, වාණිජ මණ්ඩල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, නිපුණතා සංවර්ධන නිලධාරීන් සහ ක්ෂේත්‍රවලට අදාල යූටියුබ් වීඩියෝ

## වැඩිදුර තොරතුරු සඳහා–

- පුහුණු පාඨමාලා ක්‍රියාත්මක පුහුණු ආයතන සහ වෘත්තීය මාර්ගෝපදේශන නිළධාරීන් , නිපුණතා නිළධාරීන් හමුවී සාකච්ඡා කරන්න.
- ඇලුමිනියම් බෙදුම් සහ සාප්පු ඉදිරිපස අදාළ කොටස් පිරිසැකසුම් කර නිම කිරීම පහත විස්තර කර ඇති ප්‍රමිතීන් මට්ටමකට අදාළව සිදු කිරීම
- බ්‍රිතාන්‍ය ප්‍රමිති සංගමය (BS)
- ඇමරිකානු ඇලුමිනියම් නිෂ්පාදකයින්ගේ සංගමය (AAMA)

## ඇලුමිනියම් පිරිසැකසුම් කාර්මිකයෙකු වන්නේ කෙසේද?

අනුමත පුහුණු මධ්‍යස්ථානයක ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී නිපුණතා පාදක පුහුණු (CBT) , නම්‍යශීලී ඉගණුම් පාඨමාලා (FLM) , කර්මාන්තගත පුහුණු පාඨමාලාව (EBT) හැදෑරීමෙන් ක්ෂේත්‍රයේ අත්දැකීම් සහිත පුද්ගලයින්ට පෙර දැනුම ඇගයීම් ක්‍රමය හරහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන්

## ආශ්‍රිත වෘත්තීන්

ඇලුමිනියම් නිෂ්පාදක, අලෙවි සහයක , අලෙවිකරු, නිෂ්පාදන හා ඉංජිනේරු ආශ්‍රිත සේවාවන් හා වෘත්තීන්, ඉදිකිරීම් ආශ්‍රිත ක්ෂේත්‍රයේ වෘත්තීන්

වර්තමානයේ ක්ෂේත්‍රයේ ඇති නිමවුම් අනුව පිරිසැකසුම්කරුවකුට සාපේක්ෂව ඇලුමේනියම් නිශ්පාදන ස්ථාපකයින් සඳහා අඩු කුසලතාවයක් අවශ්‍යවන බැවින් සහ නිෂ්පාදකයින් විසින් නිමවුම් භාණ්ඩයන් හඳුන්වාදීමත් සමඟ මේ සඳහා ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බව දක්නට ලැබේ.

සේවාදායකයා / පරිශීලකයා තෘප්තිමත් කිරීම සඳහා නිෂ්පාදකයා විසින් දෙන ලද උපදෙස් අනුව දොරවල් හෝ කවුළුවක් හෝ ඒවායින් කොටසක් (අගුල / සරනේරු ආදිය) සවි කිරීම අපේක්ෂා කෙරේ. නිෂ්පාදන නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ පාරිභෝගිකයාගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අදාල නිෂ්පාදන සවි කිරීම සඳහා පුහුණුව අවශ්‍ය වේ.





